**කුච්චවෙලි ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

කුච්චවෙලි ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කුච්චවෙලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා  වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක්  ලබාගන්නා  ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය  සහ  කළමනාකරණය  විසින්  කරන ලද  සම්බන්ධිත  හෙළිදරව්  කිරීම්  අගයන  ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම  අගයන  ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ඈ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සහ 2020 වර්ෂ සඳහා අවසාන වශයෙන් **ගෙවීය යුතු බිල්පත්වල වටිනාකම වෙනුවට මුළු ගිවිසුම් මුදලම ගෙවිය යුතු** ලෙසට ගිණුම්ගත කිරීම නිසා ණයහිමි වටිනාකම රු.1,837,746කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විවිධ ණයහිමි ශේෂය 2022 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිදුවූ වාහන අනතුර වෙනුවෙන් ලැබූ රු.2,500,000ක රක්ෂණ මුදල් සමුච්චිත අරමුදල් ගිණුමේ ගැලපීම් සිදුනොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂ අවසන් ගිණුම් වාර්තාවල සමුච්චිත අරමුදල් ගිණුමෙන් දෝෂය නිවැරදි කරනු ලැබේ. | පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුව ගිණුම් තැබීම සිදු කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමේ රු.2,056,485ක ආරම්භක හර ශේෂය, ලෙජර් ගිණුමේ බැර ශේෂයක් ලෙස ඉදිරියට ගෙන ඒම නිසා අවසන් ශේෂය රු.4,112,970කින් වැඩියෙන් අනාවරණය කර තිබුණි. | ඉදිරි වර්ෂ අවසන් ගිණුම් වාර්තාවල නිවැරදි කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟහිටි ආදායම් ලැයිස්තුව සහ ආදායම් හා වියදම් ගිණුමේ වර්ෂය සඳහා වූ ආදායම අතර රු.7,592,731ක වෙනස්කම් අනාවරණය විය. | ආදායම් ලෙස ලැබූ වටිනාකම පමණක් ගිණුම්වල දක්වා තිබුණි. අයනොකළ වටිනාකම හිඟහිටි ලෙස හිඟ ශේෂ විස්තරයේ සඳහන් කර ඇත. | විචලනයන් නිවැරදි කිරීමට පියවර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා රජයේ දායකත්ව ගිණුම සහ හිඟහිටි වත්කම් අතර රු. 1,658,002ක වෙනස්කම් අනාවරණය විය. | ඉදිරි වර්ෂ අවසන් ගිණුම් වාර්තාවල එම දෝෂ නිවැරදි කරනු ලැබේ. | |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.33,404,860ක් වූ අයිතමයන්ගේ නිවැරදිභාවය තහවුරු කිරිම සඳහා ලැයිස්තු, බැංකු සනාථන, බැංකු ප්‍රකාශ ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම ශේෂ වර්ෂ 10 සිට 15කට අධික කාලයක් ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවැතුණි. මේ පිළිබඳ ලිපිලේඛන නොමැත. එසේම, කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කර කපාහැරීමට හෝ නිරවුල් කිරීමට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂ නිරවුල් කිරීමට සහ තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කළයුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලන රීති මාලවේ X පරිච්ඡේදයේ 193 රීතිය | ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය සමග සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය සකස් කර නොතිබුණි. | අදාල ප්‍රකාශය සැකසීමට පියවර ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලන රීති ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | **අනෙකුත් චක්‍රලේඛ** | | | |
| (i) | 2018 ජූලි 19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත් පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් සලසා දීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ii) | 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය | ප්‍රාදේශීය සභාවේ රාජකාරි ඉටුකරනු ලබන ඇප මුදල් අයකළ යුතු නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු අයකර නොතිබුණි. | වර්තමානයේ ඇප තැන්පතු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | |
| (iii) | 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි කාලයේදි සකස් කරනු ලැබේ. | |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,869,884ක් වූ අතර ඊට ,අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,530, 213ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා තිබූ ජංගම නොවන වත්කම්වල එකතුව රු.220,080,533ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හිමිකම් ඔප්පු සහ විස්තරාත්මක ලැයිස්තු ආදිය විධිමත්ව කළමනාකරණය විසින් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් ඒවායේ භෞතික පැවැත්ම විගණනයේදි තහවුරු කළ නොහැකි විය. | නියමිත පරිදි නිවැරදි කර අනෙකුත් සියළුම ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයේ මේ වන විට පවත්වා ඇත. | ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් හිමිකම් ඔප්පු සහ විස්තරාත්මක ලැයිස්තු ආදිය විධිමත්ව පවත්වා ගතයුතුය |
| (ආ) | ආණ්ඩුකාරවරයාගේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ කාබනික පොහොර නිෂ්පාදන කාර්යයන් සඳහා රු. මිලියන 01ක ප්‍රතිපාදන සලසා මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණද, පොහොර නිෂ්පාදනය සහ විකුණුම් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම මෙහෙයුම වෙනුවෙන් දරනු ලැබූ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | කාබනික පොහොර නිෂ්පාදන කාර්යයන් සඳහා කසල රැස්කර සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත කාලයේ කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කිරීමට පියවර ගතයුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. මේ හේතුවෙන් අනෙකුත් අතුරු ව්‍යවස්ථා 25ක් මගින් ලැබිය යුතු ආදායම් සභාවට අහිමි වී තිබුණි. | ඉදිරි කාලයේ ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රයන් හඳුනාගෙන ඒ සඳහා අතුරු ව්‍යවස්ථා අනුමත කරගනු ලැබේ. | අතුරු ව්‍යවස්ථා පනවා අවශ්‍ය නියාමන කටයුතු සිදු කළයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2020 සැප්තැම්බර් 10 දින අංක KUPS/Hire.V/2020 දරන ලිපියේ ඉල්ලීමට අනුව පෞද්ගලික වාහනයක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් කුලියට ලබාගෙන සමාලෝචිත වර්ෂයේ කි.මී. 72,422ක් ධාවනය කළ බවට ධාවන සටහන්, පිටව යාමේ ගේට්ටු අවසර පත්‍ර ආදි කිසිවක් නොමැතිව සභාවේ අරමුදලින් රු.2,172,672ක් ගෙවීම් සිදුකිරීම නිසා මෙම වාහනය භාවිතා කිරීමේ විශ්වාසනීයත්වය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | කාර්යාල අවශ්‍යතාව හේතුවෙන් වාහනය කුලියට ලබාගන්නා ලදි. | ලේඛන විධිමත්ව පවත්වා ගෙන යාමට පියවර ගතයුතුය. |

## 3.4 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ අරමුදලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා රු. 2,772,615ක් වැය කර තිබූ නමුත්, ගිවිසුම් ප්‍රකාරව අවසාන කිරීමට නියමිත දිනයේ නිමැවුම් මට්ටම ළඟාකර ගෙන නොතිබූ අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය. | රටෙහි මේ වන විට පවතින ආර්ථික අර්බුදය සහ භාණ්ඩවල මිලගණන් ඉහළයාම් නිසා ගිවිසුම් නිමාවට පත්කර නැවත ගිවිසුම්ගත වීමට සභාවේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | නියමිත කාලයේ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාව විසින් 2021 වර්ෂ කාලපරිච්ඡේදයේ <u>අභ්‍යන්තර මාර්ග සහ මාර්ග පද්ධති රාජ්‍ය අමාත්‍යාංශයේ</u> මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක කළ රු.13,885,083ක ගිවිසුම් වටිනාකම වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 08ක් ඉටුකිරීමේ කාලප්‍රමාදයක් පැවැති අතර මෙම ව්‍යාපෘති සඳහා අවසාන දිනය 2021 දෙසැම්බර් 31 දින වුවත්, එම දිනය දක්වා සාමාන්‍යයෙන් සියයට 40ක ව්‍යාපෘතින් පමණක් අවසන් කර තිබුණි. එසේම, මේ සම්බන්ධ කාලය දීර්ඝකිරීම් වෙනුවෙන් ලබාගත යුතු අනුමැතියද අදාල බලධාරීන්ගෙන් ලබාගෙන නොතිබුණි. මේ හේතුවෙන් මාර්ග සංවර්ධනය මගින් ප්‍රතිලාභ ලබාගැනීමට අපේක්ෂා කරන ජනතාවට ප්‍රතිලාභ නියමිත කාල පරාසයේදි නොලැබී ගොස් තිබුණි. | ඉක්බාල් නගරයේ කානු පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර තිබුණි. අනෙකුත් අත්හැර දමා තිබූ ව්‍යාපෘතිවල ගිවිසුම් නිමාවට පත්කිරීමටත් අදාල ප්‍රජා සංවිධාන අසාධු ලේඛනගත කිරීමටත් පියවර ගෙන ඇත. | නියමිත කාලයේ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| ප්‍රාථමික මට්ටමේ තනතුරු 10ක පුරප්පාඩුත්, ද්විතියික මට්ටමේ තනතුරු 12ක පුරප්පාඩුත් වශයෙන් පුරප්පාඩු 22ක් පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සේවක පුරප්පාඩු නිරවුල් කිරිමට කටයුතු කරමින් පවතී. | නියමිත නිලධාරීන් පත්කිරීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ඔක්තෝබර් 25 දිනැති අංක PT/14/2021 දරන නැගෙනහිර පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව මූල්‍ය ප්‍රකාශන, ඉදිරිපත් කිරීමේ මාස 01 දින 08 ක ප්‍රමාදයක් පැවතුණි. එසේම, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තියට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුල්මුඩේ පිහිටි ඝාතකාගාරයෙන් පරිසරයට සිදුවන හානි සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සභාවට එරෙහිව 2019 ජූලි 05 දින නඩු පවරා තිබුණි. මේ පිළිබඳව සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධිකරණ නඩු විභාග වීම අඛණ්ඩව පැවැතීම නිසා ඉදිරි පියවර ගත නොහැකිව පවතී. නඩුව අවසන් වීමෙන් පසුව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ඝාතකාගාරවලින් පරිසරයට සිදුවන හානි වැලැක්වීමට පියවර ගතයුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

---

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන වැඩසටහන් සැලැස්ම සභාව විසින් පිළියෙල කිරිම සහ ඒ පිළිබඳ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරි කාලයේ තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කිරිමට අදාල නිලධාරියාට දැනුම් දී ඇත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |